සැ. යු.-2015.06.19 දින පළවූ අංක 1920 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,921 - 2015 ජුනි මස 26 වැනි සිකුරාදා - 2015.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1052 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1055 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1049- B 80959—5,362 (2015/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — යාපනය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජුනි මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| යාපනය | වේලනයි | පුංගුඩුතිව් කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වේලනයි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය |

06-627

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 20 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජුනි මස 06 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | බිංගිරිය | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ කරදාපත්තුව කෝරළය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

06-626

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූනි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහගල්බඩ මෙගොඩ උතුර කෝරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වැඩවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

06-750

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූනි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | මීගමුව | මීගමුව නගරය (රෝහල) කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

06-824

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූනි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3හි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | කොළඹ කොට්ඨාසයේ ශාන්ත සෙබස්තියන් පෙදෙස විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ 05 |

06-823

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 27 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජූනි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3හි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල නගරය උතුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | නෙළුව | ගාල්ල දිස්ත්‍රික්කයේ හප්පිටිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හිතිදුම්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

06-751

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### එක් රාජ්‍ය භාෂාවකට වඩා ප්‍රවීණතාව ලබා ගැනීම වෙනුවෙන් දිරි දීමනා ලබන රාජ්‍ය නිලධාරීන් සඳහා වසර 05කට වරක් පවත්වන පරීක්ෂණය - 2015

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2007.02.09 දින නිකුත් කරන ලද අංක 03/2007 චක්‍රලේඛය අනුව එක් රාජ්‍ය භාෂාවකට වඩා ප්‍රවීණතාව ලබා ගන්නා රාජ්‍ය නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම අනුමත කර ඇත. ඒ අනුව එක් වරක් පමණක් ගෙවනු ලබන දිරි දීමනාවක් හා විශ්‍රාම වැටුප් රහිත වැටුප් වර්ධකයට සමාන මාසික දීමනාවක් අනුමත කර ඇත.

02. එම වරප්‍රසාදය ලබාගත් නිලධාරීන් සෑම වසර 05කට වරක් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුවේ.

03. ඒ අනුව ඉහත වරප්‍රසාදය ලබාගත් හෝ ලබමින් සිටින නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතාව සඳහා වන පරීක්ෂණයක් 2015 සැප්තැම්බර් මස මෙම දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට තීරණය කර ඇත.

04. ඒ සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

05. එයට අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙහි දක්වා ඇති අතර, එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකි ය. ඒ අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් අංක 1 සිට 9 දක්වා පළමු පිටුවට ද, ඉතිරි කොටස දෙවැනි පිටුවට ද වන සේ තනි කොළයක අයදුම්පත සකස් කළ යුතු අතර, ඊට අදළ තොරතුරු තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ආයතන ප්‍රධානියාගේ සහතිකය සහ නිලමුද්‍රාව සහිතව 2015.07.27 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ රාජ්‍ය භාෂා කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, ''භාෂා මන්දිරය'', අංක 341/7, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වසර 05කට වරක් පවත්වන පරීක්ෂණය - 2015'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

06. විභාගය ඉල්ලුම් කරන සෑම නිලධාරියෙකුම විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. ගාස්තු ගෙවිය යුතු ආකාරය පහත පරිදි වේ. :-

| | |
|---|---|
| I මට්ටම | - රු. 1,000.00 කි. |
| II මට්ටම | - රු. 700.00 කි. |
| III මට්ටම | - රු. 500.00 කි. |

එම ගාස්තුව ''20.03.99.00 - වෙනත් ආදායම්'' ශීර්ෂයට බැරවන සේ දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගත් ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (එම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය.)

07. ඉහත සඳහන් උපදෙස්වලට සහ ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන්නා වූ හෝ, අසම්පූර්ණ වූ හෝ මුදල් ගෙවූ ලදුපත ඉදිරිපත් කර නොමැති හෝ අවසාන දිනට පසුව ලැබෙන්නා වූ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මෙම පරීක්ෂණය සම්බන්ධයෙන් වන සියලු කරුණු පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය භාෂා කොමසාරිස් සතුවේ. පරීක්ෂණය සඳහා ලබා දෙන දිනය, වේලාව හෝ මධ්‍යස්ථානය කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලැබේ. එසේම ප්‍රතිඵල නැවත සමීක්ෂණයක් ද නොකෙරේ.

09. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
රාජ්‍ය භාෂා කොමසාරිස්.

2015 ජූනි මස 12 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
''භාෂා මන්දිරය''
අංක 341/7, කෝට්ටේ පාර
රාජගිරිය.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### *එක් රාජ්‍ය භාෂාවකට වඩා ප්‍රවීණතාව ලබා ගැනීම වෙනුවෙන් දිරි දීමනා ලබන රාජ්‍ය නිලධාරීන් සඳහා වසර 05කට වරක් පවත්වන පරීක්ෂණය - 2015*

දිස්ත්‍රික්කය [ ] කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

(සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න.)

දිරි දීමනාව ලබාගන්නා භාෂාව [ ] මට්ටම [ ]

| | |
|---|---|
| සිංහල - 2 | I මට්ටම - 1 |
| දෙමළ - 3 | II මට්ටම - 2 |
| | III මට්ටම - 3 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

දිරි දීමනාව ලබාගන්නා භාෂාව සහ මට්ටම නිවැරදිව සඳහන් කළ යුතු ය. පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

1. මුලකුරු සමඟ නම :––––––––.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   (*උදා :* GAMINI R. A. )

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :––––––––.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :––––.
   (*උදා :* රණතුංග ආරච්චිගේ ගාමිණී)

4. රාජකාරි ලිපිනය :––––––––.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   (ප්‍රවේශ පත්‍රය, මෙම ලිපිනයට තැපැල් කෙරේ.)

5. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

6. දුරකථන අංකය : | | | | | | | | | | |

7. ඔබ අයත් සේවය : (මධ්‍යම රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය)

8. භාෂා දිරි දීමනාව ලබන තනතුර :————.

9. භාෂා දිරි දීමනා හිමිකම ලැබූ දිනය :————.

10. (i) ඔබ රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගයට පෙනී සිටි දිනය :————.

(ii) වාචික පරීක්ෂණයට පෙනී සිටි දිනය :————.

(iii) රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ වලංගු දිනය (ප්‍රතිඵල සටහනෙහි සඳහන් පරිදි) :————.

(iv) විභාග අංකය :————.
(ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් ආයතන ප්‍රධානියා මගින් සහතික කර අමුණා එවිය යුතුය)

11. විභාග ගාස්තු : රු. :————. ගෙවූ කාර්යාලය :————.
ලදුපත් අංකය :————.

ලදුපත මෙහි අලවන්න

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, විභාගයට අදළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන්, රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත්, විභාග නීතිරීතිවලට යටත් වන බවත්, මේ සම්බන්ධ *ගැසට් නිවේදනයේ* සියලු කොන්දේසි කියවා තේරුම්ගත් බවත් මා මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.
(ආයතන ප්‍රධානියා ඉදිරිපිට දී)

දිනය :————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අයදුම්කරු මාගේ කාර්යාලයේ සේවයේ නියුතු බවත්, අයදුම්පතෙහි 1 - 11 හි සඳහන් තොරතුරු නිවැරදි බවත්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දිරි දීමනා ලබා ගන්නා භාෂාවෙන් කාර්යාලීය රාජකාරි කටයුතු (ලිපි ලිවීම/භාෂා පරිවර්තන/භාෂණ පරිවර්තන/මහජන සන්නිවේදන කටයුතු යනාදිය) සඳහා නිලධාරියා/නිලධාරිනිය සක්‍රීයව දයක වන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරිපිට දී ……………… දින තබන ලද බවත් සහතික කරමි.

අත්සන :————. දිනය :————.
නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

06-828

---

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2014 අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දෙවන බස සිංහල හෝ දෙමළ භාෂාව සමත් වූ රාජ්‍ය නිලධාරීන් හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධාරීන් සඳහා වන වාචික පරීක්ෂණය - 2015

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ සිංහල (විෂය අංක 21 හෝ 64) හෝ දෙමළ (විෂය අංක 22 හෝ 65) සමත් නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2014 අනුව **රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගයේ ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලබන අතර, එම නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.**

02. එම වාචික පරීක්ෂණය 2015 වර්ෂයේ සැප්තැම්බර් මස පැවැත්වීම සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. ඒ සඳහා ඉල්ලුම් කළ හැක්කේ.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට විවෘත, සීමිත හා කුසලතා පදනම මත 2007.07.01 දින සිට බඳවා ගනු ලැබූ/පත්කරනු ලැබූ නිලධාරීන්ට හා

- කළමනාකරණ චක්‍රලේඛ 04/2014 අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන්ට.

03. ආදර්ශ අයදුම්පත්‍රය මෙහි දක්වා ඇති අතර, එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept. gov.lk වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය. ඒ අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් අංක 1 සිට 7 දක්වා පළමු පිටුවට ද, ඉතිරි කොටස දෙවන පිටුවට ද වන සේ තනි කොළයක අයදුම්පත සකස් කළයුතු අතර, ඊට අදළ තොරතුරු තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. **අයදුම් කරනු ලබන භාෂාව හා ප්‍රවීණතා මට්ටම නිවැරදිව සඳහන් කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වෙනස් කිරීම් සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ඉල්ලුම් කළයුත්තේ ස්වකීය සේවාවට හෝ තනතුරට නියමිත ප්‍රවීණතා මට්ටම පමණි, අයදුම්පත සමග ආයතන ප්‍රධානි විසින් සහතික කරන ලද අ. පො. ස. (සා. පෙළ.) විභාග ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් අමුණා එවිය යුතුය.**

04. විභාගය ඉල්ලුම් කරන සෑම නිලධාරියෙකුම විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. ගාස්තු ගෙවිය යුතු ආකාරය පහත පරිදි වේ.

- I මට්ටම - රු. 1,000.00 කි
- II මට්ටම - රු. 700.00 කි
- III මට්ටම - රු. 500.00 කි
- IV මට්ටම - රු. 300.00 කි

එම ගාස්තුව ''20.03.99.00 - වෙනත් ආදායම්'' ශීර්ෂයට බැරවන සේ දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගත් ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසු ය.)

05. ඉහත සඳහන් උපදෙස්වලට අනුකූල වන සේ සම්පූර්ණ කරන ලද අයදුම්පත ආයතන ප්‍රධානියාගේ සහතිකය සහ නිල මුද්‍රාව සහිතව 2015.07.27 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''රාජ්‍ය භාෂා කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, ''භාෂා මන්දිරය'', 341/7, කෝට්ටේ පාර, රාජගිරිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත

බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''අ. පො. ස. (සා. පෙළ.) - වාචික පරීක්ෂණය 2015 (. . . . මට්ටම)'' යනුවෙන් සඳහන් කළ යුතුය.

06. මීට පෙර වාචික පරීක්ෂණය සඳහා අයදුම් කර ඇති නමුත් ප්‍රතික්ෂේප වූ හෝ පරීක්ෂණයට ඉදිරිපත් නොවූ හෝ වාචික පරීක්ෂණය අසමත් වූ හෝ නිලධාරීන් මෙම පරීක්ෂණය සඳහා නැවත අලුතින් විභාග ගාස්තු ගෙවා ඉල්ලුම් කළ යුතුය.

07. ඉහත සඳහන් උපදෙස්වලට සහ ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන්නා වූ හෝ, අසම්පූර්ණ වූ හෝ මුදල් ගෙවූ ලදුපත අලවා නොමැති වූ හෝ අ. පො. ස. (සා. පෙළ.) විභාගයේ ප්‍රතිඵල ලේඛනය සත්‍ය පිටපතක් බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර නොමැති වූ හෝ අවසාන දිනට පසුව ලැබෙන්නා වූ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඊට අදළ අභියාචනා භාර ගනු නොලැබේ.

08. ඉල්ලුම් කරනු ලබන දිස්ත්‍රික්කයෙහි විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ඔවුන් ඊට යාබද දිස්ත්‍රික්කයේ විභාග මධ්‍යස්ථානයට යොමු කරනු ඇත.

09. වාචික පරීක්ෂණය සඳහා ලබා දෙන දිනය, වේලාව හෝ මධ්‍යස්ථානය කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලැබේ. එසේම ප්‍රතිඵල නැවත සමීක්ෂණයක්ද නොකෙරේ.

10. මෙම පරීක්ෂණය සම්බන්ධයෙන් වන සියලු කරුණු පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය භාෂා කොමසාරිස් සතු වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
රාජ්‍ය භාෂා කොමසාරිස්,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

2015 ජූනි මස 11 වැනි දින,
341/7, 'භාෂා මන්දිරය',
කොට්ටේ පාර,
රාජගිරිය.

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

***අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දෙවන භාෂාව සමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සහ සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන නිලධාරීන් සඳහා වන වාචික පරීක්ෂණය - 2015***
***සිංහල/දෙමළ (I, II, III, IV මට්ටම)***

දිස්ත්‍රික්කය : [ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ..............................

(ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.)

තනතුර/සේවා නාමය [ ]

තනතුරට අයත් සේවය : [ ]
(අදළ අංකය
කොටුව තුළ ලියන්න) :

| | |
|---|---|
| මධ්‍යම රාජ්‍ය සේවය | - 1 |
| පළාත් රාජ්‍ය සේවය | - 2 |
| සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන | - 3 |

වාචික පරීක්ෂණය සඳහා
පෙනී සිටින භාෂාව [ ] සිංහල - 2 දෙමළ - 3
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන මට්ටම
(අදළ අංකය කොටුව තුළ ලියන්න.) [ ]

| | | |
|---|---|---|
| I වන මට්ටම | - 1 | |
| II වන මට්ටම | - 2 | (අදාළ අංකය කොටුව තුළ |
| III වන මට්ටම | - 3 | ලියන්න.) |
| IV වන මට්ටම | - 4 | |

1. මුලකුරු අගට යොදා, අයදුම්කරුගේ නම (උදා : SAMARASINGHE, S. A. S. K.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම :—————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) (උදා: සමරසිංහ ආරච්චිගේ සමන් කුමාර සමරසිංහ) :—————.

4. රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

5. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍රය හා ප්‍රතිඵල සටහන මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :—————.

6. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

7. දුරකථන අංකය : [ | | | | | | | | | ]

8. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු තනතුරට පත්වූ දිනය :—————.

9. අ. පො. ස. (සා.පෙළ) විභාගය පිළිබඳ තොරතුරු
(ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත ආයතන ප්‍රධානියා මගින් සහතික කර අමුණා එවිය යුතුය)
9.1 විභාග අංකය :—————.
9.2 පෙනී සිටි භාෂාව හා විෂය අංකය :—————.
9.3 වර්ෂය :—————.

10. විභාග ගාස්තුව රු. :—————. ගෙවූ කාර්යාලය :—————.

ලදුපත් අංකය :—————.

විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙහි අලවන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, මෙම භාෂාව සම්බන්ධයෙන් වෙනත් මට්ටමක් සඳහා ඉල්ලුම් කර නැති බවත්, විභාගයට අදළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන්, රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත්, විභාග නීතිරීතිවලට යටත් වන බවත්, වාචික පරීක්ෂණය සම්බන්ධ ගැසට් නිවේදනයේ සියලු කොන්දේසි කියවා තේරුම්ගත් බවත් මා මෙයින් ප්‍රකාශ කරමි.

අත්සන :—————. (ආයතන ප්‍රධානියා ඉදිරිපිට දී අත්සන තබන්න.)

දිනය :—————.

ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත අයදුම්කරු මාගේ කාර්යාලයේ සේවය කරන බවත්, අයදුම්පතෙහි අංක 1 හා 10 දක්වා ඡේදයන්හි සඳහන් තොරතුරු නිවැරදි බවත් 01/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය /04/2014 කළමනාකරණ චක්‍රලේඛය අනුව ඔහු/ඇය වසර 05ක් තුළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත්, ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරිපිට දී .................. දින තබන ලද බවත් සහතික කරමි.

අත්සන :————. දිනය :————.
නම :————.
තනතුර :————.
නිලමුද්‍රාව :————.

06-827

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - විදුලි කාර්මික III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2015

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ විදුලි කාර්මික III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පමණක් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් විදුලි කාර්මික III ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩුව සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

02. වැටුප් ක්‍රමය.- අංක 06/2006 (IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව විදුලි කාර්මික තනතුරේ III, II, I හා විශේෂ ශ්‍රේණිවලට අදාල මාසික වැටුප් පරිමාණය.

රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600
රු. 13,510 න් ඔබ්බට යාම සඳහා II ශ්‍රේණියට උසස් වීමද
රු. 14,900 න් ඔබ්බට යාම සඳහා I ශ්‍රේණියට උසස් වීමද
රු. 16,560 න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය.

03. සේවා කොන්දේසි :-
මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අදාළ පරිදි දායක විය යුතුය. මෙය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට සීමා වූ තනතුරකි. එසේ වුවද දෙපාර්තමේන්තුව තුළ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත් කරනු ලැබිය හැකිය. මෙම සේවා ගණයේ III ශ්‍රේණියට පවත්නා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් බඳවාගන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

04. සුදුසුකම් :-
විදුලි කාර්මික III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1997.07.24 දින හෝ ඊට පෙර හා 1970.07.24 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.
අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

(ඉ) වෘත්තීය සුදුසුකම් :
අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

(ඊ) පළපුරුද්ද.—අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

* සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ නියමිත සුදුසුකම් 2015.07.24 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. විභාග පරිපාටිය :
මෙය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් යුක්තය. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| i. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 |
| ii. | අතිරේක වෘත්තීය සුදුසුකම් | 45 |
| iii. | පළපුරුද්ද | 10 |
| iv. | පෞරුෂත්වය | 05 |
| | මුළු ලකුණු | 100 |

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එම ලකුණු ප්‍රදානය කිරීම සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව, පවතින පුරප්පාඩුවට බඳවාගනු ලැබේ.

06. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ව්‍යුහගත

සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

07. විභාග ගාස්තු :-

විභාග ගාස්තු රු. 250.00 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ 2015.07.24 දින හෝ එදිනට පෙර හෝ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට් පතෙහි ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

08. අයදුම්පත්‍රය A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්

(අ) අංක 1 සිට 3 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 4 සිට 8 තෙක් ඡේදයන් දෙවන පිටුවට ද,

(ඇ) අංක 09 සිට 11 තෙක් ඡේදයන් තෙවන පිටුවටද, ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත්වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය.

(ඈ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයෙහි සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

- නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය *ගැසට් නිවේදනයේ* දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බලා තහවුරු කර ගත යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "විදුලි කාර්මික තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2015" යන්න සඳහන් කරන්න.

8.3 අයදුම්පත්‍රයේද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක, විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, නීතිඥවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු 240,260 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2015.07.24 වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

9. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :-

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක, ෆැක්ස් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රවේශපත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට, එම ලිපිය ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසා සිටීමද සුදුසුය. තවද ඔබගේ තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබා ගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානම්ව තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. අපේක්ෂකයෙකු හට ප්‍රවේශපත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලටද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2015 ජුනි මස ......... වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - විදුලි කාර්මික III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2015
Primary Semi Skilled Service Category - Structured Interview for recruitment to the Post of Electrician Grade III - 2015

(දෙන ලද කොටුව තුළ නිවැරදිව සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම : :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :ස්ත්‍රී -1/පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.3 2015.07.24 දිනට වයස :

අවුරුදු මාස දින

3.4 දුරකථන අංකය :

4.0 අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| *පාඨමාලාව* | *හැදෑරූ වර්ෂය* | *තාක්ෂණික ආයතනය* | *NVQ මට්ටම* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

6.0 වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

7.0 අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :————.

8.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :————.

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් නැත

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

10.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

(ඇ) තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

11.0 අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………… මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී …… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ………… මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ………… ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

06-829

---

### අධ්‍යාපන අමාත්‍යාංශය

#### 2016 අධ්‍යයන වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම

2016 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය සහ යාපනය යන විශ්වවිද්‍යාලවල පැවැත්වේ.

03. එක් එක් විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකිය.

1. කොළඹ විශ්වවිද්‍යාලය - සිංහල සහ දෙමළ මාධ්‍යය
2. පේරාදෙණිය විශ්ව විද්‍යාලය - සිංහල මාධ්‍යය
3. යාපනය විශ්ව විද්‍යාලය - දෙමළ මාධ්‍යය

04. සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතු ය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම
(ii) 2015.07.24 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි වීම.
(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයෙන් සහ යහපත් චරිතයකින් යුක්ත වීම
(iv) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම
(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලබා සේවය කිරීම

(අ) * ශ්‍රීලංකා ගුරු සේවය
* ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය
* ශ්‍රී ලංකා පරිවේනාචාර්ය සේවය
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය
(ඇ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය
(ඉ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

(vi) 2015.07.24 වැනි දිනට අංක 04 (v) හි දක්වා ඇති සේවාවකට අයත් තනතුරක උපාධිධාරියෙකු ලෙස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සැලකිය යුතුයි :-* 1 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීම් ලබා ඇති ගුරුවරුන් 2015.07.24 වැනි දිනට තම පත්වීමේ බැඳුම්කරයේ කාලසීමාව වන අනිවාර්ය පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ වී තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

2. අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයට යටත්ව සිටින අයදුම්කරුවන් 2015.07.24 වැනි දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්යය සේවා කාලය

අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක්වත් (05) සම්පූර්ණ කර තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

3. අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකිය.

05.1 *තෝරා ගැනීමේ පිළිවෙල :*

(i) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) ගැසට් නිවේදනයේ අංක 04 (v) හි අයදුම්කරු අයත් වන සේවාවට අදාළ තනතුරෙහි සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත. සේවා කාලය එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ. සේවා කාලය සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. අයදුම්කරුවෙකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු/ඇය අදාළ තනතුරේ වැඩ භාරගත් දිනයේ සිට ය.

(iv) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම්කළහොත් පාඨමාලාවට තෝරාගනු ලබන සංඛ්‍යාවෙන් 1% ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.

(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලබන සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

05.2 *ලිඛිත පරීක්ෂණය :*

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවල දී පැවැත්වේ.

(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා ඉල්ලුම් කළ මධ්‍යස්ථානයේ දී ඉල්ලුම් කළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකි ය. අයදුම්කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.

(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳ ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයින් විසින් කටයුතු කළ යුතු ය.

(iv) ලිඛිත පරීක්ෂණයක ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත ය.

(*අ*) සාමාන්‍ය දැනීම :-
කාලීන තොරතුරු, සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටලු පිළිබඳ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01)

(*ආ*) අභියෝග්‍යතාවය :-
භාෂා හැකියාව, අවබෝධය, තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01 යි මිනිත්තු 30 යි)

05.3 *සම්මුඛ පරීක්ෂණය :-*

(i) සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතු ය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* අංක 04 (v) හි අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන්ම තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතුය. එම අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණු ලබා ගැනීමට උපකාර වනු ඇත.

(iii) පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරුභවතුන්,

(*අ*) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත්,
(*ආ*) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බවටත්,
(*ඇ*) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදාගන්නා බවටත්,
(*ඈ*) අදාළ ගුරුභවතාගේ අධ්‍යයන කාලය තුළ ඔහු/ඇය ගේ පුරප්පාඩුවට වෙනත් ගුරුවරයෙකු බඳවා නොගන්නා බවටත්,
(*ඉ*) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත්, ආයතනයේ කෘත්‍යාධිකාරී/පාලක මණ්ඩල කළමණාකරු විසින් සහතික කරන ලද ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

06.*අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) දී ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කළ යුතුය.

(ii) දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතු පාටින් "දෘශ්‍යාබාධිත/ ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි." යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) විභාග ගාස්තු ගෙවීම :
විභාග ගාස්තු වශයෙන් රු. 750 ක මුදලක් ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි අලවන්න.

2015.06.26 දින සිට 2015.07.24 දින දක්වා සියලුම තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවනු ඇත.

(iv) අයදුම්පත් එවීම :

(*අ*) අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව - 2016" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(*ආ*) 2015.07.24 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.

(ඈ) ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට ආයතන ප්‍රධානියා මඟින් භාරදිය යුතු වේ. එය පාඨමාලාව සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී උපකාරී වනු ඇත.

(v) කාලසටහන් හා ප්‍රවේශපත්‍ර විභාග අපේක්ෂකයින් වෙත තැපැල් මඟින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාග පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර නොලැබුණහොත් "විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිතව දැන්විය යුතු වේ.

(අ) විභාගයේ නම :————.
(ආ) විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(ඇ) ලිපිනය :————.
(ඈ) මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.
(ඉ) ඉල්ලුම්පත තැපැල් කළ දිනය :————.
(ඊ) ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාරදීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව, වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මඟින් තහවුරු කළ යුතුය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවෙකු යම් විශ්වවිද්‍යාලයකට, තෝරා ගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරා ගැනීමෙන් පසුව වුව ද ගැසට් නිවේදනයට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂයෙකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදුවේ.

07. *අධ්‍යයන නිවාඩු* :

තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ ජාතික පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවයේ නියුක්ත විදුහල්පති ශ්‍රේණිධාරීන් සහ ගුරුවරුන් අධ්‍යයන නිවාඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද සෙසු අයදුම්කරුවන් අධ්‍යයන නිවාඩු අදාළ පළාතේ අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කර ගත යුතු වේ.

08. *බැඳුම්කරය* :

පාඨමාලාවට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීතිරීති අනුව නියමිත කාල පරිච්ඡේදයක් ඔහු/ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට අධ්‍යාපන ලේකම්/පළාත් අධ්‍යාපන ලේකම් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු වේ.

09. තෝරාගනු ලැබූ අයදුම්කරුවෙකු පාලනය කර ගත හැකි හේතුන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාලසීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ඇත.

11. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

උපාලි මාරසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 ජූනි මස 26 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***2016 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීම***

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| *ඉල්ලුම් කරන මාධ්‍යය (සිංහල/දෙමළ)* | *ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය)* | *ඉල්ලුම් කරන විශ්ව විද්‍යාලය (කොළඹ/යාපනය/පේරාදෙණිය)* |
|---|---|---|
| | | 01.<br>02. |

01. (i) මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන්) :————.
උදා : Mr. SILVA, A. B. C.

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) (අ) රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) රාජකාරී දුරකථන අංකය :————.

(ii) (අ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) පෞද්ගලික දුරකථන අංකය :————.

(iii) සේවය කරන පාසලේ/ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය |
|---|---|---|
| | | |

(iv) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/පෞද්ගලික පාසල්/පිරිවෙන්/වෙනත්) :————.

03. (i) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(ii) 2015.07.24 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

04. උපාධිය පිළිබඳ විස්තර :

| උපාධිය | විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය ( ……සිට …… දක්වා) | උපාධිය සමත්වූ වසර | උපාධිය වලංගු දිනය | උපාධි විෂයයන් | සාමාර්ථයේ ස්වභාවය | ආයතනය /විශ්ව විද්‍යාලය | උපාධිය (අභ්‍යන්තර/ බාහිර |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

05. (i) (අ) ශ්‍රී ලංකා ගුරු සේවයට පත් වූ දිනය :————.
(ආ) ශ්‍රී ලංකා ගුරු සේවයේ වැඩ බාරගත් දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.

(ii) (අ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය :————.
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ භාරගත් දිනය :————.

(iii) උපාධියෙන් පසු 2015.07.24 වැනි දිනට ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා කාලය :————.

(iv) 2015.07.24 වැනි දිනට ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සම්පූර්ණ සේවා කාලය :————.

06. වෘත්තීය පුහුණුව පිළිබඳ විස්තර :

| පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත්) | පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය) | ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාලසීමාව | |
|---|---|---|---|
| | | දින සිට | දින දක්වා |
| | | | |

07. ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :

| *අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය* | *බැඳුම්කර කාලය ...... දින සිට ...... දින දක්වා* | *බැඳුම්කරය සම්පූර්ණ කිරීමට ඉදිරියට ඇති කාලය* |
|---|---|---|
| | | |

**සටහන** : ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදූරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැලකේ.

08. (අ) ඉල්ලුම්කරුට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවතීද? ඔව්/නැත.
(ආ) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු :

09.

| | |
|---|---|
| තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | කුවිතාන්සි අංකය :<br>දිනය :<br>.........තැපැල්/උප තැපැල් කාර්යාලයට<br>රු. ......... (මුදල අකුරෙන්) ගෙවන ලද බවට සහතික කරමි.<br>අයදුම්කරුගේ අත්සන :.........<br>දිනය :......... |

10. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

මෙම ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බවටද, 2015.06.26 වැනි දින ගැසට් නිවේදනයේ 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවට ද, විභාග පනතේ අයදුම්කරුවන් සඳහා වූ නීතිරීතිවලට එකඟව කටයුතු කරන බවට ද නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවට ද මෙයින් සහතික වෙමි.

_________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :_________.

11. පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීම පිළිබඳ නිර්දේශය :

(විදුහල්පති, පීඨාධිපති, කෘත්‍යාධිකාරී, පාලක මණ්ඩලයේ කළමණාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා)

පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සලකා බලා මෙම අයදුම්කරු නිදහස් කරමි/නොකරමි.

_________,
විදුහල්පතිගේ/ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :_________.

12. පාඨමාලාව සඳහා ගුරුභවතා නිදහස් කිරීම පිළිබඳ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය :

උක්ත නම් සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි.

_________,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිල මුද්‍රාව.)

දිනය :_________.

06-795

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ජාතික වෘත්තීය පුහුණු ආයතනය-නාරාහේන්පිට

*2015 දෙවන අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම*

පූර්ණ කාලීන පාඨමාලා

| *No.* | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fees (Rs.)* |
|---|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D | 12,000 0 |
| 2 | CCNA Academy Program | Non | 6 | D | 40,000 0 |
| 3 | Computer Graphic Designer | IV | 6 | A | 12,500 0 |
| 4 | Adobe Certified Associate | Non | 6 | D | 15,000 0 |
| 5 | NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | N | 7,500 0 |
| 6 | Computer Graphic Designer (ශ්‍රවණාබාධිත) | IV | 6 | - | Free |
| 7 | Baker | IV | 6 | A | 30,000 0 |
| 8 | Cook | IV | 6 | A | 30,000 0 |
| 9 | Waiter/Steward | III | 6 | I | 4,500 0 |
| 11 | Automobile A/C Mechanic | IV | 6 | A | 2,700 0 |
| 12 | Beautician | IV | 6 | B | 20,000 0 |
| 13 | Hairdresser | IV | 6 | B | 30,000 0 |
| 14 | Diploma in Industrial Management | Non | 6 | E | 25,000 0 |
| 15 | Offset Lithographic Operator | IV | 6 | I | 5,500 0 |
| 16 | Machinist (CNC Milling) | IV | 6 | C | 6,000 0 |
| 17 | Driver - Heavy Vehicle | Non | 3 | F | 9,000 0 |
| 18 | Driver - Light Vehicle | Non | 3 | G | 10,500 0 |
| 19 | Auto Painter | III | 6 | B | 2,000 0 |

අර්ධ කාලීන පාඨමාලා

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee* (Rs.) |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 12,000 0 |
| CCNA Academy Program | 300 | D | 40,000 0 |
| PC Based Application Assistant (Ms Office) | 100 | I | 9,500 0 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 22,500 0 |
| ICT Technician (NVQ IV) | 350 | A | 20,000 0 |
| IC3 + International Certificate | 120 | K | 10,000 0 |
| CCN Security | 150 | J | 20,000 0 |
| Photographer | 150 | P | 40,000 0 |
| Auto Cad (2D) | 80 | L | 7,500 0 |
| Auto Cad (3D) | 80 | L | 8,000 0 |
| Baker | 100 | B | 14,000 0 |
| Cook | 100 | B | 14,000 0 |
| Cut & Style hair (Ladies) | 100 | B | 10,250 0 |

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|
| Facials and Skin care Treatmet | 100 | B | 10,500 0 |
| Make-up and Bridle Dressing | 80 | B | 11,000 0 |
| Auto Mobile Technician (Engine/Petrol/Diesel) | 160 | B | 10,500 0 |
| Draughtsmanship (Building Drawing) | 150 | D | 13,500 0 |
| CNC Programming | 125 | A | 9,000 0 |
| Electrical Wiring Industrial | 120 | A | 14,500 0 |
| Electrical Wring Domestic | 120 | A | 13,000 0 |
| Motor Control System | 100 | A | 13,000 0 |
| Automobile A/C Mechanic | 125 | B | 13,000 0 |
| English Language | 100 | B | 10,500 0 |

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2015.07.15 දිනට වයස අවු. 17ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාදා/ඉරිදා දිනයන්හි හා සන්ධ්‍යා කාලීනවද පැවැත් වේ.

ප්‍රතිලාභ :

- දේශීය විදේශීය රැකියා අවස්ථා
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්
- ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක්
- විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම
- දීමනා සමඟ මාස 06ක වැඩිදුර පුහුණුව

සුදුසුකම් :

A අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06කින් සමත් වීම.
B 9 වසර සමත් වීම
C ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී A2 L3 සහතික ලබා තිබීම
D අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වීම
E පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/වැඩ මූලික සහායක/වැඩ අධීක්‍ෂක රැකියාවක අවුරුදු 02ක පළපුරුද්දක් තිබීම.
F 9 වසර සමත්වීම හා අවුරුදු 21ට වැඩිවීම හා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය ලබා වසර 3ක් ගතවී තිබීම.
G 9 වසර සමත්වීම සහ අවුරුදු 18ට වැඩිවීම
H අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම සහ මූලික පරිඝණක පාඨමාලාවක් හදාරා තිබීම.
I අ. පො. ස. (සා. පෙළ) පෙනී සිටීම
J CCNA පාඨමාලාවක් හදාරා සිටීම.
K අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයන් 06කින් සමත් වී තිබීම.
L මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලි සිටීම.
M අ. පො. ස. (උ. පෙළ) විෂයන් 2කින් සමත්වීම
N අ. පො. ස. (සා/පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 6කින් සමත්වීම.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2015.07.03 දිනට පෙර පහත ලිපිනයට එවන්න.

සහකාර අධ්‍යක්‍ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථනය : 011-2592233
011-7277111 (IT centre)
ඊ- මේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112-592233

06-656

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**2015 II වන අර්ධ වර්ෂයට ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 2015 II වන අර්ධ වර්ෂයට ආධුනිකයන් බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තිය සුදුසුකම්) පාඨමාලා හා Non NVQ (ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලා)සංකේත අංක යටතේ පහත දක්වා තිබේ. NVQ මට්ටම, පාඨමාලා ගාස්තු හා පාඨමාලා කාලය ද සඳහන් කර ඇත.

පාඨමාලා සඳහා අයදුම් කිරීම :

දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික වෘත්තීය පුහුණු ආයතනවල ලිපිනය හා ක්‍රියාත්මක පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබෙන අතර ඔබ කැමති පාඨමාලාවක් තෝරාගෙන අදාළ දිස්ත්‍රික්කයට/ජාතික වෘත්තීය පුහුණු ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම් පතක් යොමු කළ යුතුය. අයදුම්පත්‍රය මේ සමග ඉදිරිපත් කෙරෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව 13", 8" ප්‍රමාණයෙන් සකස් කළ යුතු වේ. ඔබ විසින් අයදුම්පත යොමු කරන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආධුනිකයන් බඳවා ගැනීම - 2015 II අයදුම්පත් යොමු කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

| | |
|---|---|
| අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය | - 2015.07.07 |
| පාඨමාලා ආරම්භය | - 2015.07.20 |
| වැඩි විස්තර සඳහා : | |
| දුරකථන අංක | - 011-2505123<br>011-7270270 |
| Fax අංක | - 011 2502342 |
| Email | - cgjp@vtasl.gov.lk |
| වෙබ් ලිපිනය | - www.vtasl.com |
| ෆේස්බුක් පිටුව | - www.facebook.com/vtasl |

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
04 වන මහල,
නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

*ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ*
*පුහුණුව සමඟ ඔබට*

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්‍ෂණ උපාධිය ලබා ගැනීමේ අවස්ථාව
- විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසිකව රු. 1,000 සිට 2,000 දක්වා මාසිකව දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම වාර ප්‍රවේශ පත්‍ර
- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තීය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- නොමිලේ නිල ඇඳුම්

*පුහුණුවෙන් පසු ඔබට*

- මාසික දීමනාවක් සමගින් වැඩිදුර පුහුණුව
- රජයේ පිළිගත් සහතිකයක්
- විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමඟ ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළුව මඟින් දැනුම යාවත්කාලීන කිරීම
- වෘත්තීය අධ්‍යාපනය තුළින් කාර්මික ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පුහුණු කාලය (මාස) | NVQ Levels | Free |
|---|---|---|---|---|
| | **මෝටර් රථ අළුත්වැඩියාව සහ නඩත්තුව** | | | |
| 1 | මෝටර් කාර්මික - ජාතික සහතිකය | 30 | 4 | 6,000 |
| 2 | මෝටර් කාර්මික - ජාතික සහතිකය | 18 | 3 | 3,000 |
| 3 | මෝටර් රථ විදුලි කාර්මික - ජාතික සහතිකය | 18 | 3 | 4,000 |
| 4 | මෝටර් රථ වායු සමීකරණ ශිල්පි - ජාතික සහතිකය | 12 | 3,4 | 2,700 |
| 5 | රියදුරු (බර වාහන) | 3 | Non | 9,000 |
| 6 | රියදුරු (සැහැල්ලු වාහන) | 3 | Non | 10,500 |
| 7 | මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | 2,000 |
| 8 | මෝටර් රථ වෑද්දුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 | Free |
| 9 | යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | 1,000 |
| 10 | ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී | 12 | 3,4 | 1,000 |
| 11 | කෘෂි උපකරණ කාර්මික - ජාතික සහතිකය | 18 | 3,4 | Free |
| 11A | කර්මාන්ත කාර්මික උපකරණ ශිල්පී | 24 | Non | 2,000 |
| 12 | ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරු(ස්කැවේටර්/බැකෝ ලෝඩර්/මෝටර් ග්‍රේඩර්) | 1 | 3,4 | 43,250 |
| | **විදුලි විද්‍යුත් සහ විදුලි සංදේශ** | | | |
| 13 | විදුලි ශිල්පී - ජාතික සහතිකය | 30 | 4 | 5,000 |
| 14 | විදුලි ශිල්පී - ජාතික සහතිකය | 18 | 3 | 2,500 |
| 15 | විදුලි ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 | Free |
| 16 | ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා | 18 | 4 | Free |
| 17 | ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා | 12 | 3 | Free |
| 18 | විදුලිමෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 19 | ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා | 30 | 4 | 4,000 |
| 20 | ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා | 18 | 3 | 3,000 |
| 21 | වායුපීඩක තාක්‍ෂණ ශිල්පී - ජාතික සහතිකය | 18 | 4 | 6,000 |
| 22 | ජංගම දුරකථන අළුත්වැඩියා කරන්නා | 12 | Non | Free |
| 22A | බහුවිධ කාර්මික ශිල්පී (විදුලි) | 12 | Non | 2,000 |
| | **තොරතුරු තාක්‍ෂණ සන්නිවේදනය තාක්‍ෂණය** | | | |
| 23 | පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය | 12 | 3,4 | 7,500 |
| 24 | පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය CISCO +A+ සහතිකය | 12 | 4 | 12,000 |
| 25 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලාව | | | |
| | (NVQ Level 4 in ICT) | 12 | 4 | 7,500 |
| 27 | ජාතික තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ | | | |
| | ඩිප්ලෝමා පාඨමාලාව (NVQ Level 5 in ICT) | 12 | 4 | 40,000 |
| 28 | පරිගණක ජාල පාඨමාලාව (CISCO networking) | 300Hrs | Non | 40,000 |
| 29 | "Adobe " සහතිකපත්‍ර පාඨමාලාව(Graphic/Video/Web) | 6 | Non | 14,900 |
| 30 | මෘදුකාංග පාඨමාලාව-ජාතික සහතිකය(නාරාහේන්පිට) | 6 | Non | 20,000 |
| 31 | ග්‍රැපික් නිර්මාණ ශිල්පී -ජාතික සහතිකය(නාරාහේන්පිට) | 12 | 4 | 12,500 |
| 32 | ග්‍රැපික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 4 | 10,000 |
| 32 A | ග්‍රැපික් නිර්මාණ ශිල්පී (ශ්‍රවනාබාධිත)(නාරාහේන්පිට) | 12 | 4 | Free |
| | **හෝටල් හා සංචාරක** | | | |
| 33 | වෘත්තීය සූපවේදී ජාතික සහතිකය(නාරාහේන්පිට) | 12 | 4 | 30,000 |
| 34 | සූපවේදී ජාතික සහතිකය | 12 | 4 | 6,000 |
| 35 | සූපවේදී ජාතික සහතිකය | 12 | 3 | 3,500 |
| 36 | කාමර සේවක - ජාතික සහතිකය | 12 | 3 | 3,500 |
| 37 | භෝජනාගාර සේවක - ජාතික සහතිකය | 12 | 3,4 | 4,500 |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පුහුණු කාලය (මාස) | NVQ Levels | Free |
|---|---|---|---|---|
| | **මැණික් හා ස්වර්ණාභරණ** | | | |
| 38 | ස්වර්ණාභරණ කාර්මික(අත් නිමැවුම්) - ජාතික සහතිකය | 18 | 3,4 | Free |
| 39 | ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| | **පුද්ගල හා සමාජ** | | | |
| 41 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | 6 | 4 | 7,000 |
| 42 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය (නාරාහේන්පිට) | 6 | 4 | 20,000 |
| 43 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | 6 | 3 | 3,000 |
| 44 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය (නාරාහේන්පිට) | 6 | 4 | 30,000 |
| 45 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 4 | 10,000 |
| 46 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 3 | 4,000 |
| 47 | පෙර පාසල් ගුරු - ජාතික සහතිකය | 18 | 3,4 | 6,000 |
| 47A | සාත්තු සේවක පුහුණු පාඨමාලාව | 12 | 4 | 15,000 |
| 47B | ගබඩා භාරකරු | 12 | 4 | 2,000 |
| 47C | වෘත්තීය පුහුණු උපදේශක | 48 | 5 | 10,000 |
| | **ආහාර තාක්ෂණය** | | | |
| 48 | වෘත්තිමය බේකරි ශිල්පී(නාරාහේන්පිට) | 12 | 4 | 30,000 |
| 49 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | 12 | 4 | 6,000 |
| 50 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 | 3,500 |
| 51 | පලතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම්කරු | 12 | 3,4 | Free |
| | **දැව ආශ්‍රිත** | | | |
| 52 | ලී කැටයම් ශිල්පී | 12 | Non | Free |
| 53 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | 18 | 3,4 | Free |
| 54 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | 12 | 3 | Free |
| 55 | ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) - ජාතික සහතිකය | 30/18/12 | 3,4 | Free |
| | **රෙදිපිළි හා ඇඟලුම්** | | | |
| 56 | මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 4 | 2,000 |
| 57 | මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 | 1,500 |
| 58 | අධිවේගී මහන යන්ත්‍ර කාර්මික - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 59 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 9 | 3,4 | Free |
| 60 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | 12 | 4 | 1,500 |
| 61 | තිර මුද්‍රණකරු | 12 | Non | Free |
| 62 | ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 12 | 3,4 | 1,000 |
| 63 | ඇඟලුම් නිෂ්පාදන සුපරීක්ෂක - ජාතික සහතිකය | 12 | 4 | 5,500 |
| 64 | ඇඟලුම් තත්ත්ව පාලක - ජාතික සහතිකය | 12 | 4 | Free |
| 65 | ඇඟලුම් තත්ත්ව පාලක - ජාතික සහතිකය (German School) | 12 | 4 | 3,000 |
| 68 | වැඩ අධ්‍යයන නිලධාරි - ජාතික සහතිකය | 12 | 4 | 12,000 |
| 68A | ජීව වෛද්‍ය උපකරණ තාක්ෂණ ශිල්පය | 18 | 4 | 50,000 |
| | **ලෝහ හා ලුහු ඉංජිනේරු** | | | |
| 69 | යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය | 18 | 4 | 3,500 |
| 70 | යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය | 18 | 3 | 3,000 |
| 71 | යන්ත්‍ර ශිල්පී (ලියවන පට්ටල් ක්‍රියාකරු) | 12 | 3 | 2,500 |
| 72 | යන්ත්‍ර ශිල්පී(CNC මෙහෙලුම් යන්ත්‍ර ක්‍රියාකරු)නාරාහේන්පිට | 10 | 4 | 6,000 |
| 73 | යන්ත්‍ර ශිල්පී ( CNC මෙහෙලුම් යන්ත්‍ර සහ ලියවන | 12 | 4 | 8,000 |
| | පට්ටල් ක්‍රියාකරු) - ජාතික සහතිකය (නියාගම / චන්ද්‍රාරමුල්ල) | | | |
| 74 | වැද්දුම්කරු (සාමාන්‍ය) | 18 | 4,3 | Free |
| 76 | ලෝහ පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | 18 | Non | Free |
| 77 | පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | 18 | 4 | Free |
| 78 | පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | 18 | 3 | Free |
| 79 | පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 | Free |
| 80 | පෑස්සුම් ශිල්පී - (Gas/Arc & Mag) ජාතික සහතිකය(නියාගම) | 18 | 4 | 4,100 |
| 80A | බහුවිධ කාර්මික ශිල්පී (යාන්ත්‍රික) | 12 | Non | 2,000 |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පුහුණු කාලය (මාස) | NVQ Levels | Free |
|---|---|---|---|---|
| | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | | |
| 75 | ඇළුමිනියම් පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 82 | ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 84 | ජලනල කාර්මික - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 87 | සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය | 12 | 4 | 25,000 |
| 89 | උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 89A | බහුවිධ කාර්මික ශිල්පී (සිවිල්) | 12 | Non | 2,000 |
| | **මුද්‍රණ සහ ඇසුරුම්** | | | |
| 90 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 12 | 4 | 5,500 |
| 91 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 12 | 2,3 | 3,200 |
| | **කෘෂිකර්ම වැවිලි සහ පශු සම්පත්** | | | |
| 92 | තවාන් පාලනය හා පැල බද්ධකරු | 12 | Non | Free |
| 94 | එළවළු හා පලතුරු වගාකරු | 12 | Non | Free |
| | **ශීතකරණ හා වායුසමීකරණ** | | | |
| 95 | ශීතකරණ හා වායුසමීකරණ කාර්මික- ජාතික සහතිකය | 18 | 3,4 | 3,000 |
| | **සම් ආශ්‍රිත නිෂ්පාදන** | | | |
| 97 | සම් පාවහන් නිෂ්පාදක - ජාතික සහතිකය | 12 | 3,4 | Free |
| 98 | රබර් නිෂ්පාදනය (ගම්පහ) | 12 | 3,4 | Free |
| | **කාර්යාල කළමණාකරණය** | | | |
| 99 | ලේකම් පරිචය | 15 | Non | 5,500 |
| 99A | ලේකම් පරිචය | 12 | 4 | 2,000 |
| | **වෙනත්** | | | |
| 100 | කාර්මික කළමණාකරණ ඩිප්ලෝමාව (නාරාහේන්පිට) | 6 | Non | 25,000 |

| | දිස්ත්‍රික්කය/ ජා.වෘ.පු.ආ | පාඨමාලා අංකය |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය අංක 354, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,කොළඹ 5. 011 2592233 | 4,5,7,24,25,28,29,31,32A,33,37,42,44,48,90,100,47,47A,89A,80A, 22A,11A,47C,68A,99A,47B |
| 2 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, අංක 100 කඳවල පාර, රත්මලාන. 011-2638850 | 7,15,19,24,25,32,54,71,75,79,89 |
| 3 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, මිරිජ්ජවිල, හම්බන්තොට. 0472220501 | 6,24,25,41,45,95 |
| 4 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, මාකුරුගොඩ පාර, බද්දේගම. 091-2293119 | 18,24,25,32,34,37,49,75,84 |
| 5 | සහකාර අධ්‍යක්ෂ, කොරියානු ශ්‍රී ලංකා ජාතික තාක්ෂණික විද්‍යාලය, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, නියාගම, තල්ගස්වල, ගාල්ල. 091-2296445 | 2,6,15,19,23,25,27,43,46,54,55,70,72,80,82,84,95 |
| 6 | සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, තලල්ල දකුණ, කෝට්ටේගොඩ, මාතර 041-2259331 | 6,23,25,34,41,44,49,54,84,89 |
| 7 | සහකාර අධ්‍යක්ෂ, (කොළඹ) දිස්ත්‍රික් වෘ.පු.ම., මහාමේඝ පෙදෙස, මහරගම. 011-2844151 | 3,4,7,10,15,23,25,32,35,39,41,45,47,49,59,60,62,75,79,82,84,89,99 |

| | දිස්ත්‍රික්කය/ ජා.වෘ.පු.ආ | පාඨමාලා අංකය |
|---|---|---|
| 8 | සහකාර අධ්‍යක්ෂ, (ගම්පහ). දිස්ත්‍රික් වෘ.පු.ම., බණ්ඩාරනායක මාවත, වේයන්ගොඩ. 033 -2294790 | 2,3,5,6,9,10,13,15,18,19,24,25,32,35,36,37,41,45,50,54,56,58,60,62,71, 78,89,95,98,80A,22A,11A |
| 9 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම., , ටැල්බට් ටවුම, ගාල්ල. 091-2234540 | 1,10,12,15,18,23,24,25,32,36,41,43,45,46,51,54,56,58,59,60,61,64, 65,68,79,75,82,84,91 |
| 10 | සහකාර අධ්‍යක්ෂ, (කළුතර) දිස්ත්‍රික් වෘ.පු.ම., වැවල, හොරණ. 034 -2263698 | 1,3,4,19,10,15,18,24,25,32,35,36,41,45,50,51,56,59,60,63,64, 75,79,84,89,92,95 |
| 11 | සහකාර අධ්‍යක්ෂ, (මහනුවර) දිස්ත්‍රික් වෘ.පු.ම., ගන්නෝරුව පාර, පේරාදෙණිය 081-2387200,081 -3804599 | 10,15,18,19,24,25,34,37,41,45,60,75,79,89 |
| 12 | සහකාර අධ්‍යක්ෂ,(මාතලේ) දිස්ත්‍රික් වෘ.පු.ම., ඉනාමළුව, දඹුල්ල. 066-2286683 | 10,15,23,25,35,34,41,45,47,56,50,52,60,37,54,61,82,84,95,99, 47A, 89A,80A,22A,11A,47C,68A,99A,47B |
| 13 | සහකාර අධ්‍යක්ෂ,(පොළොන්නරුව), දිස්ත්‍රික් වෘ.පු.ම., නාගලකන්ද විහාර පාර, මින්නේරිය 011-3158918, 027-2245442 | 2,10,15,24,25,43,46,47,50,54,59,60,79,75,82,99A |
| 14 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම., නුවර වැව පාර, අනුරාධපුරය 025-2221400 | 1,4,10,15,24,25,35,41,43,45,46,47,54,59,60,61,75,79,82, 84,89,97, 11A,99A |
| 15 | සහකාර අධ්‍යක්ෂ,(ත්‍රිකුණාමලය) දිස්ත්‍රික් වෘ.පු.ම., යොවුන් මාවත, කන්තලේ. 026-2234517 | 75,43,82,34,15,46,25,84,60,79,54, |
| 16 | සහකාර අධ්‍යක්ෂ, (බදුල්ල) දිස්ත්‍රික් වෘ.පු.ම., අඹේගොඩ, බණ්ඩාරවෙල, 057-2223043 | 01,10,15,18,19,24,25,35,41,43,45,46,50,54,60,64,75,79,82,84,99 |
| 17 | සහකාර අධ්‍යක්ෂ, (මොණරාගල) දිස්ත්‍රික් වෘ.පු.ම., කුමාරදාස මාවත, වැල්ලවාය. 055-2274775 | 75,2,43,23,82,35,15,18,46,47,17,25,71,19,95,60,62,10,79,54,89A,80A, 22A,11A,47C,99A |
| 18 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කාර්‍යාලය, කොටුව, මාතර. 041-2235950 | 8,10,15,18,25,32,38,41,43,45,46,54,57,58,60,61,64,79,75,82,84,95 |
| 19 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම., සාරගම, කුරුණෑගල. 037-2237436 | 4,7,10,15,24,25,35,41,43,46,52,57,58,60,61,64,75,79,82,84,89 |
| 20 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම.,බල්ලපාන, ගලිගමුව නගරය, කෑගල්ල 035-2282565 | 7,6,10,25,23,34,41,45,84,89,99,60,54,15,82,75,79 |
| 21 | සහකාර අධ්‍යක්ෂ,(පුත්තලම) දිස්ත්‍රික් වෘ.පු.ම., හලාවත පාර, මාරවිල, 032-2254110 | 50,41,32,34,18,45,47,36,37,18,79,10,25,24,82,15,60,75,43,46,47A,99A |
| 22 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම.,හේනකඩුව, තංගල්ල, හම්බන්තොට. 047-2241724 | 4,8,10,15,18,24,25,32,34,37,41,43,45,46,50,54,57,59,60,62,70,75,79, 82,84,89,91 |
| 23 | සහකාර අධ්‍යක්ෂ,(රත්නපුර) දිස්ත්‍රික් වෘ.පු.ම., පනාවැන්න, කහවත්ත. 045-2274699 | 10,15,18,24,25,35,41,43,45,46,47,50,54,57,59,60,78,79,82,11A,99A |
| 24 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම.,මහවීදිය, නින්දවූර්,අම්පාර 067- 2250196, 067-2251155 | 75,87,50,49,43,23,82,35,34,15,18,64,46,25,59,9,84,95,36,60,62,10, 37,79,54 |
| 25 | සහකාර අධ්‍යක්ෂ, (මඩකළපුව)ජාතික/දිස්ත්‍රික් වෘ.පු.ම.ආයතනය, APC පාර, වන්දාරමුල්ල 065 - 2240159 | 25,47,54,75,43,82,15,46,54,84,19,60,62,10,73,79,82,11A,47C,99A |
| 26 | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘ.පු.ම.,වෙඩබන් පාර, නුවරඑළිය 052-2223216 | 2,10,41,23,35,37,15,64,45,25,36,60,75,79 |

පාඨමාලාව හැදෑරීම සඳහා අවම සුදුසුකම්
09 වසර සමත්වීම

- ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - ජාතික සහතිකය
- ජලනල කාර්මික - ජාතික සහතිකය
- උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය
- ලී කැටයම් ශිල්පී
- ලී වැඩ කාර්මික ශිල්පී
- මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය
- මෝටර් රථ වෑද්දුම් ශිල්පී - ජාතික සහතිකය
- යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය
- ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී
- කෘෂි උපකරණ කාර්මික - ජාතික සහතිකය
- පලතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම්කරු
- කාමර සේවක - ජාතික සහතිකය
- ලෝහ පිරිසැකසුම්කරු - ජාතික සහතිකය
- පැස්සුම් ශිල්පී - ජාතික සහතිකය (මාස 18/30)
- ස්වර්ණාභරණ කාර්මික(අත් නිමැවුම්) - ජාතික සහතිකය
- ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය
- මැණික් කැපුම් ශිල්පී
- තවාන් පාලනය හා පැල බද්ධකරු
- මල් හා විසිතුරු පැළ වගාකරු
- එළවළු හා පලතුරු වගාකරු
- අධිවේගී මහන යන්ත්‍ර කාර්මික - ජාතික සහතිකය
- අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය
- ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය
- තිර මුද්‍රණකරු
- ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය
- ෆැබ්රික් කටර් - - ජාතික සහතිකය
- සම් පාවහන් නිෂ්පාදක - ජාතික සහතිකය
- රබර් නිෂ්පාදක
- රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය
- කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය

*අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06 කින් සමත්වීම*

- ඉදිකිරීම් වැඩ කළමනාකරණය
- සැලසුම් ශිල්පී - ජාතික සහතිකය
- මෝටර් කාර්මික - ජාතික සහතිකය
- මෝටර් රථ විදුලි කාර්මික - ජාතික සහතිකය
- මෝටර් රථ වායු සමීකරණ ශිල්පී - ජාතික සහතිකය
- විදුලි ශිල්පී - ජාතික සහතිකය
- ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා
- ජංගම දුරකථන අළුත්වැඩියා කරන්නා
- ශීතකරණ හා වායුසමීකරණ කාර්මික- ජාතික සහතිකය
- වෘත්තීය සුපවේදී (සුපවේදී ජාතික සහතිකය සහ වෘ. පු. ආ. සහතිකය)(නාරාහේන්පිට)
- පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය
- ග්‍රැපික් නිර්මාණ ශිල්පී -ජාතික සහතිකය(නාරාහේන්පිට)
- ග්‍රැපික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය
- යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය
- යන්ත්‍ර ශිල්පී (ලියවන පට්ටල් ක්‍රියාකරු)- ජාතික සහතිකය
- මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය
- ඇඟලුම් නිෂ්පාදන සුපරීක්ෂක - ජාතික සහතිකය
- ඇඟලුම් තත්ව පාලක - ජාතික සහතිකය
- ෆැබ්රික් ඉන්ස්පෙක්ටර් - ජාතික සහතිකය

*අ. පො. ස. (උ. පෙළ) විෂයයන් 03 කින් සමත්වීම*

- සැලසුම් ශිල්පී - ජාතික ඩිප්ලෝමාව

*අ. පො. ස. (උ. පෙළ) විෂයයන් 02 කින් සමත් වීම*

- සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය

*අ. පො. ස. (උ. පෙළ) ගණිතය හෝ විද්‍යාව අංශයෙන් විෂයයන් 03 කින් සමත්වීම හෝ NVQ 4 සුදුසුකම්*

- ප්‍රමාණ සමීක්ෂක -ජාතික ඩිප්ලෝමාව

*අ. පො. ස. (සා. පෙළ) පෙනී සිටීම*

- ලී වැඩ කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ)- ජාතික සහතිකය
- ලී වැඩ කාර්මික ශිල්පි (ගොඩනැගිලි)- ජාතික සහතිකය
- විදුලි ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
- ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය
- විදුලිමෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය
- බේකරි ශිල්පි - ජාතික සහතිකය
- සූපවේදී ජාතික සහතිකය
- භෝජනාගාර සේවක - ජාතික සහතිකය
- ඇළුමිනියම් පිරිසැකසුම්කරු කාර්මික- ජාතික සහතිකය
- ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය
- මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්)- ජාතික සහතිකය

*09 වසර සමත්වීම හා අවුරුදු 21ට වැඩිවීම හා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය ලබා වසර 03 ක් ගතව තිබීම.*

- රියදුරු (බර වාහන)

*09 වසර සමත්වීම හා අවුරුදු 18ට වැඩිවීම*

- රියදුරු (සැහැල්ලු වාහන)

*අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 03කින් සමත් වීම*

- කෘෂි යන්ත්‍ර උපකරණ කාර්මික - ජාතික සහතිකය
- වෑද්දුම්කරු (සාමාන්‍ය)
- පැස්සුම් ශිල්පි - ජාතික සහතිකය (මාස 18)

*අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව අතුළුව විෂයයන් 06 කින් සමත්වීම*

- ගුවන් විදුලි, රූපවාහිනි සහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය
- වායුපීඩක තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය

*අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම*

- පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය A+ සහතිකය
- CISCO Computer Nnetworking Course(CCNA)
- "Adobe " වෘත්තීය සහතිකපත්‍ර පාඨමාලාව
- මෘදුකාංග පාඨමාලාව-ජාතික සහතිකය
- ලේකම් පරිචය

*ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2L3සහතික ලබා තිබීම*

- යන්ත්‍ර ශිල්පී (CNC මෙහෙයුම් යන්ත්‍ර ක්‍රියාකරු) - ජාතික සහතිකය
- යන්ත්‍ර ශිල්පී (CNC මෙහෙයුම් යන්ත්‍ර ලියවන පට්ටල් ක්‍රියාකරු) - ජාතික සහතිකය

*ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී L3 සහතික ලබා තිබීම*

- පැස්සුම් ශිල්පී - ජාතික සහතිකය

*අ. පො. ස. (උ. පෙළ) සමත්වීම*

- වැඩ අධ්‍යයන නිලධාරි - ජාතික සහතිකය
  පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු වීම හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික, වැඩ මූලික සහායක, වැඩ අධීක්ෂක රැකියාවක වසර 02 ක පළපුරුද්ද තිබීම.
- කාර්මික කළමණාකරණ ඩිප්ලෝමාව
  අයදුම්පත් 2015.07.07 දිනට පෙර තෝරාගත් දිස්ත්‍රික්කවල සහකාර අධ්‍යක්ෂ වෙතට යොමු කරන්න.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය*

2015 - II වන අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. පදිංචිය :————.
   (i) ග්‍රාමසේවා වසම :————.
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
4. දුරකථන අංකය :————.
5. උපන් දිනය :————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :————.
7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :————.

ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථානය අනුපිළිවෙළින් සඳහන් කරන්න.

| පාඨමාලා | අදාළ මධ්‍යස්ථානය |
|---|---|
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

.............................. ..............................
දිනය අයදුම්කරුගේ අත්සන

ඔබගේ අයදුම්පත් පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂගේ ලිපිනයට 2015.07.07 වැනි දිනට පෙර යොමු කරන්න.

06-646

---

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ''ව්‍යාපෘති සහායක'' (නොවිධිමත් අධ්‍යාපන) තනතුරුධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2015)**

01 ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2015 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනවා ඇත.

(iii) මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පත්වීම් ලද අදළ නිලධාරීන්ට පමණි.

03. *විභාග ගාස්තු :*
පළමුවන වතාවට මෙම සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයකට අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු වතාවක එක් විෂයයකට පමණක් පෙනී සිටින්නේ නම් රු. 200 ක විභාග ගාස්තුවක් සහ එක් විෂයයකට වැඩි ගණනක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 400 විභාග ගාස්තුවක් අය කෙරේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003.02.13 යටතේ රජයේ ආදයමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. ගෙවන ලද විභාග ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04.1 *අයදුම් පත්‍ර :*

ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුයි. මෙම ආදර්ශ අයදුම්පත අනුව ඒ4, ප්‍රමාණයේ කඩදසියක පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමු වන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත්, වන ලෙස ගෙන සකස් කල යුතු ය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි

ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද, යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2015.08.11 වැනි දිනට පෙර** ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ආයතන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත සමග පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා එවිය යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එම ඉල්ලුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

04.2 *අත්සන සහතික කිරීම* :

අයදුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන, ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂයින් විසින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන ලියකියවිලි අතරින් කුමක් හෝ භාරගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

2. වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. අයදුම්පත් යොමු කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 3කට වත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සටහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි වන සේ අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණි. ඒ අතරින් තමන් අධ්‍යාපන ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. *විභාග පරිපාටිය* - ඉහත තනතුරුවලට අදළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය පරිපාලනය : (ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා රෙගුලාසි) | 01 | 100 | පැය 1 1/2 |
| 02. | මුදල් රෙගුලාසි | 02 | 100 | පැය 1 1/2 |
| 03. | අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය | 03 | 100 | පැය 1 1/2 |
| 04. | ඉංග්‍රීසි භාවිතය | 04 | 100 | පැය 1 1/2 |

(01) *සාමාන්‍ය පරිපාලනය* :

(*අ*) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය වැඩි අවධානයක් ඇතිව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පළාත් සභා පනත් (සංශෝධන සහිතව);

(*ආ*) පළාත් සභා විසින් සංශෝධිත ප්‍රඥප්තිය;

(*ඇ*) ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ කාර්යාල කළමනාකරණය, කාර්යාල ක්‍රම

ආයතන සංග්‍රහයේ I, II, III, IV, V, VI, VII, VIII, IX, X, XI, XVI XXV, XXVI, XXVII, XXIX, XXI, XXXII,XXXIII, XLVII, XLVIII දරන පරිච්ඡේද.

(02) *මුදල් රෙගුලාසි හා ගිණුම් කටයුතු :*

(අ) රජයේ මුදල් රෙගුලාසි (1 කොටස) (x පරිච්ඡේදය හැර),

(ආ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට වැඩි අවධානය ඇතිව ප්‍රවර්තන වර්ෂයේ ආදායම් හා වැය ඇස්තමේන්තුව, ඒවායේ සැකසීම, ආදායම් ශීර්ෂ මුදල් හා විසර්ජන පනත්,

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල මඟින් ඉටු කරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදළ වන ආඥා පනත් සහ වෙනත් නීතිමය විධිවිධාන හා රෙගුලාසි,

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවල භාවිත කරනු ලබන ගිණුම් කාර්ය පටිපාටින්

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ, අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛවල මුදල් හා ගිණුම් අංශවලට අදළ විධිවිධාන හා ඉදිරියට බලපවත්නා විධිවිධාන හා රෙගුලාසි.

(03) *අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය :*

(අ) අපේක්ෂකයන් පහත සඳහන් ආඥාපනත් සහ පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබිය යුතුය.

- 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත
- 1947 අංක 26 දරන සංශෝධිත අධ්‍යාපන ආඥාපනත,
- 1951 අංක 05 දරන සංශෝධිත පනත,
- 1953 අංක 43 දරන සංශෝධිත පනත,
- රජයේ පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය,
- 1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන පනත),
- 1961 අංක 08 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (අතිරේක විධිවිධාන පනත),
- 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත,
- 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධිත) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත,
- 1979 අංක 64 දරන පිරිවෙන් පනත හා ඒ යටතේ නිකුත් කර ඇති රෙගුලාසි
- 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) සංශෝධිත පනත
- 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත,
- 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත,
- 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරි පනත,
- අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි
- ළමා අයිතිවාසිකම් හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනවනු ලැබූ අණපනත් සහ පවත්වන ලබන නීති වල සංශෝධන,
- ළමා අධිකාරි පනත සහ ඉදිරියට බල පවත්නා පනත් පිළිබඳව

(ආ) *අධ්‍යාපන පරිපාලනය :*

- අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති,
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්,
- ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් අධ්‍යාපනික සැලසුම් කිරීම,
- පරමාර්ථ ක්‍රම (පාසල් සැලසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය,
- පාසැල් කළමනාකරණය හා පාසැල් ප්‍රජා සම්බන්ධතා,
- අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධති,
- විශේෂ අධ්‍යාපන වැඩ සටහන්.

(ඇ) *අධ්‍යාපන සමීක්ෂණය :*

- පාසල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධන ඇගයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන (වෘත්තිය සමාලෝචන හා ප්‍රති පුහුණු වැඩ සටහන්),
- පාසල්වල අඛණ්ඩව ඇගයීම් වැඩ සටහන්,
- පාසල්වල ස්වයං ඇගයීම් වැඩ සටහන්,
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් අධීක්ෂණය කිරීම,
- බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය.

(ඈ) *නොවිධිමත්, සන්තතික සහ විශේෂ අධ්‍යාපන පරිපාලනය සංවර්ධනය හා අධීක්ෂණය :*
(අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.)

(iv) ඉංග්‍රීසි භාවිතය :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අතර තත්ත්වයේ ප්‍රායෝගික භාවිතය.

- සන්නිවේදන දක්ෂතා
- ව්‍යාපාරික ලිපි
- දෙබස්
- ඉල්ලුම්පත්
- සම්මුඛ පරීක්ෂණ
- වාර්තා
- සරල ඡේදයක දී අර්ථය පැහැදිලි වී ඇත්දැයි බැලීමට කෙටි ප්‍රශ්න

(සාමාර්ථයක් ලැබීම සඳහා එක් එක් විෂයේ ලකුණු වලින් අවම වශයෙන් 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් නිලධාරියා විසින් ලබාගත යුතු වේ.)

11. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. සිංහල හා දෙමළ භාෂාවලින් පල කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එස්. යූ. විජේරත්න,
අතිරේක ලේකම් (සැලසුම්)
වැ. බ. අධ්‍යාපන ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 ජූනි මස දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
''ඉසුරුපාය''
බත්තරමුල්ල

ආදර්ශ අයදුම්පත්‍රය

**අධ්‍යාපන අමාත්‍යාංශයේ "ව්‍යාපෘති සහායක" (නොවිධිමත් අධ්‍යාපන) තනතුරුධාරීන් සඳහාවන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 (2015)**

The First Efficiency Bar Examination for "Project Assistant" (Nonformal Education) in the Ministry of Education - 2014 (2015)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

අදාළ අංකය කොටුව තුළ ලියන්න.
සිංහල - 2
දෙමළ - 3

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : HERAHT MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDANA

1.1 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. : GUNAWARDANA, H. M. S. K.

1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. සේවා ස්ථානය හා ලිපිනය :
2.1 සේවා ස්ථානයේ නම :—————.
2.2 රාජකාරි ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. දැනට දරන තනතුර :—————.
(පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න.)

5.1 පත්වීම් ලිපියේ අංකය :—————.

5.2 පත්වීම් දිනය :—————.

06. ඔබ ඉදිරිපත් වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන්
(ගැසට් නිවේදනයේ 10 වන ඡේදය බලන්න.)

| අනු. අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බවද ප්‍රකාශ කරමි.

—————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :—————.

සටහන - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

ලදුපත එහි එක් දරයකින් මෙහි අලවන්න. (අදළ නම් පමණි)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අත්සන සහතික කිරීම

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/ගුරු මධ්‍යස්ථානයේ/නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ……………… මයා/මිය/මෙනවිය ……… දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මම සහතික කරමි.

—————,
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.
(ආසන්නතම මාණ්ඩලික නිලධාරියා.

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා ඇති බවත්,
3. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,
4. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බව/නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/ පීඨාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.
(අදාළ නොවන වචන කපා හරින්න)

06-769

**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2015

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවෙහි පුහුණුව සඳහා අභ්‍යාසලාභිනියන් බඳවා ගැනීමට 2012, 2013, 2014 යන වර්ෂවල සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| සංකේත අංකය | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාල සීමාව | පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|
| 1 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | වසර 1 1/2<br>(ක්ෂේත්‍ර පුහුණුව මාස 06කි) | සිංහල, දෙමළ |

1. අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ලබා ගන්නා ලද Z අගය අනුව කුසලතා ලේඛන සකස් කර දීප ව්‍යාප්ත කුසලතාවය මත 30%ක් ද, පළාත් කුසලතාවය මත 70%ක්ද වන ලෙස සුදුස්සන් තෝරා ගනු ලැබේ. පුහුණු පාඨමාලාවන්ට එම පළාත්වලින් බඳවාගත හැකි අභ්‍යාසලාභිනියන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු ප්‍රමාණය පදනම් කර ගනිමින් තීරණය කරනු ලැබේ.

   මෙම පාඨමාලාව සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගයේ Z අගය පදනම් කරගෙන වර්ෂ කිහිපයක ඕනෑම විෂය ධාරාවකින් උසස් පෙළ විෂයයන් 03 සමතුන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති බැවින්, පුහුණුව සඳහා අවශ්‍ය මුළු අභ්‍යාසලාභිනියන් සංඛ්‍යාව තෝරා ගැනෙනුයේ ඉහත සඳහන් වර්ෂවල සුදුසුකම් ලත් මුළු අයදුම්කරුවන්ගේ එකතුවෙන් එම වර්ෂවල අ.පො.ස. (උ.පෙළ) විභාගයේ එක් එක් විෂය ධාරාවෙන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයක් වශයෙනි. අයදුම් කරන පළාත තුළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි පුරප්පාඩු නොමැති වුවහොත් එම පළාත්වලින් අයදුම් කරන අයදුම්කරුවන් දීප ව්‍යාප්ත කුසලතාවය මත පමණක් පදනම්ව තෝරාගනු ලැබේ.

2. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාද පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදරන සිසුවියන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම්කර පසු අවස්ථාවකදී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   2.1 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් පාඨමාලාවට බඳවාගන්නා දින වන වියට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුවද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින් එවැනි අයදුම්කාරියන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

   2.2 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

*සැලකිය යුතුය :*

* ඉහත 2.1 සිට 2.2 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබේ නම්, අනිවාර්යයෙන්ම මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේ ය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මඟින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබාගත යුතු ය.

* එම 2.1 සිට 2.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

* එමෙන්ම ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද, 2.1 සිට 2.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගතයුතු ය.

3. තනතුරට අදළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 1 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | සිංහල භාෂාව/දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) සමත්වීම. | 2012, 2013, 2014 යන වර්ෂ වල අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක්වරක දී විෂයන් තුනකින් සමත්වීම. | * අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි<br>* උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතු ය.<br>* සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු අතර පුහුණු කාල සීමාව තුළ විවාහ නොවිය යුතු ය. න්‍යායික පුහුණුව ලබා දී තාවකාලිකව සේවයේ යොදවන සිසුවියන් ද විධිමත් පුහුණුව සඳහා අනුයුක්ත කර පත්වීම් ලබා දෙන තෙක් විවාහයට ඇතුළත් නෙවිය යුතුය. |

4. අනෙකුත් පොදු සුදුසකම් :

(අ) 2015.07.24 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. අදළ සුදුසුකම් සපුරන 2012, 2013, 2014 යන වර්ෂවල අ.පො.ස. (උ.පෙළ) සමතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(ආ) පුහුණුවෙන් පසු බඳවා ගන්නා පළාත තුළ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට කැමැති විය යුතු ය.

(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය.

5. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදසි භාවිතා කළ යුතු ය. අයදුම්පතේ 1 සිට 10 (අ) දක්වා පළමු පිටුවේ ද, 10 (ආ) සිට 13 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය.

(ආ) අයදුම්පතෙහි " 'ලදුපත' යන ස්ථානයේ ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට" රු. 300 ක් බැර කර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් ලබා ගන්න.)

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 240,360/කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත එක් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2015" වශයෙන් සඳහන් කොට 2015.07.24 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

6. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබාගත යුතු ය.

7. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

8. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා මෙම නිවේදනයේ දක්වෙන නියමයන්ට හා අදළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්ගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කාරිනියන් විසින් පහත සඳහන් ලියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතු ය.)

(ඇ) අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල දක්වෙන සහතිකයේ මුල් පිටපත ;

(ඈ) ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ;.

(ඉ) ඉහත 4 (ඈ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිළධාරී සහතිකය) ;

(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ;

(උ) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටින බවට දිවුරුම් ප්‍රකාශයක්.

10. *පුහුණු කිරීමේ පටිපාටිය* :

(i) සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කාරිනියන් අතරින් තෝරාගත් අයදුම්කාරිනියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් සිංහල/දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය යුතුය.

(ii) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභිනියන් පුහුණු පාසල්වලබල පැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝග වලට යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීනියන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

(iv) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීනියන්ට රු. 12,360ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් අදාළ පළාතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත්, ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත්, හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරණ ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඇය විසින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

11. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ පළාත තුළ පවත්නා පුරප්පාඩු මත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරේ III වන පංතියේ තනතුරට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ. අභ්‍යාසලාභීනියන්ගේ මුල් පත්වීමේ සිට වසර දහයක් යනතෙක් පුහුණුව සඳහා තෝරාගෙන ඇති පළාතේ සේවය කළ යුතුය.

පාඨමාලාව අවසානයේදී පැවැත්වෙන අවසන් ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සකස් කරනු ලබන කුසලතා ලේඛනය පදනම් කරගෙන සහ ඉහත පළාත් මට්ටමෙන් බඳවාගනු ලැබූ 70% ක ප්‍රතිශතය හා දීප ව්‍යාප්ත කුසලතාවය මත බඳවා ගනු ලැබූ 30%ක ප්‍රතිශතය ද සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින ආයතන වෙත පත්වීම් ලබාදීමට සලකා බැලීම සිදුකෙරේ. එහිදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) හි MT 05 2006A (රු. 15,260 - 180 x 6 - 240 x 4 - 320 x 20 - 360 x 20 -රු. 28,020) වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරෙහි තබා වැටුප් ගෙවනු ඇත.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණු වෙන්/තනතුරින් පහකරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛණයට ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළ දී ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදළ මුදල ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

13. තෝරාගත් අයදුම්කාරියන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කාරියන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවාගන්නා ලද සියලුමදෙනා රජයේ සේවකයින්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

15. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උද වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

16. පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කාරියන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

17. මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම පුහුණුවෙන් පසුව ඔබ අදල තනතුරේ පත්වීම් ලදහොත් ඉන් පසුව ද, පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

ආචාර්ය ඩී. එම්. ආර්. බී. දිසානායක,
ලේකම්,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2015 ජුනි මස 04 වැනි දින,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම් පත්‍රය

අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණුව සඳහා අභ්‍යාසලාභිනියන් බඳවා ගැනීම - 2015

- අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න -

- අයදුම්කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්) :————.
- අයදුම්කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්) :————.

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසියෙන් කැපටල් අකුරෙන්) උදා : A. B. C. SILVA

(ආ) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3. තැපැල් ලිපිනය :

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

4. (අ) ස්ථිර ලිපිනය :

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

(ආ) දුරකථන අංකය : ජංගම ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් :—————. ඉංග්‍රීසියෙන් :—————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද?: ඔව්/නැත :—————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද ? :—————.

5. උපන් දිනය : වර්ෂය :—————, මාසය :—————, දිනය :—————.

2015.07.24 දිනට වයස :-
අවුරුදු :—————. මාස :—————. දින :—————.

6. උපන් දිනය : වර්ෂය :—————, මාසය :—————, දිනය :—————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න).

8. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද? යන වග : ඔව් ☐ නැත : ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න).

9. විවාහක/අවිවාහක බව : විවාහක : ☐ අවිවාහක : ☐

10. අධ්‍යාපන සුදුසුකම්:

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය [Zඅගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න.]

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :—————.

විෂය ධාරාව :—————. විභාගයට පෙනී සිටි වර්ෂය :—————.

විභාග අංකය : Zඅගය :—————.

| # | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගය [ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න].

| # | විෂයය : | පළමුවර | | දෙවනවර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය : | | වර්ෂය : | |
| | | විභාග අංකය : | | විභාග අංකය : | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව /දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

11. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් ☐ නැත ☐
(අදළ කොටුවේ ලකුණ යොදන්න). ( ✓ )
ඔව් නම් විස්තර සපයන්න.

12. අයදුම්කාරියගේ සහතිකය :

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

ලදුපත මෙහි නොගැලවෙන සේ අලවන්න

දිනය :————.

————,
අයදුම්කාරිනියගේ අත්සන.

13. අයදුම්කාරිනියගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඇය ....................................දින මා ඉදිරිපිටදී ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

* සහතික කරන නිලධාරියගේ සම්පූර්ණ නම :————.

* තනතුර :————.
* ලිපිනය :————.

සහතික කරන්නාගේ නිල මුද්‍රාව :————.

06 - 604

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.